ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
இலங்கை தேசிய கிறிஸ்தவ மன்றம்
National Christian Council of Sri Lanka

**ශ්‍රී ලංකාවේ පවතින දේශපාලන අර්බුදය පිළිබඳව**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශය**

වත්මන් ආර්ථික අර්බුදය පසෙකලා අප දේශය ගැඹුරු දේශපාලන ව්‍යසනයක් කරා ගෙන යමින්, රටේ දිග හැරෙමින් ඇති සිදුවීම් මාලාව පිළිබඳව ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) දැඩි ලෙස කම්පනයට පත්ව සිටී. ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සභා නායකයින් වන අප මෙම විනාශකාරී වර්ධනයන් බැරෑරුම් ලෙස සැලකිල්ලට ගනිමින්, පහත සඳහන් දෑ පැහැදිලිව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු.

1. පවතින දූෂිත පාලන ක්‍රමය නොබියව විවේචන කරමින් සහ රටේ බහුතර ජනයා අපේක්ෂාවෙන් සිටි නීතියේ ආධිපත්‍යය සුරැකිම ඇතුළු අත්‍යාවශ්‍ය ආර්ථික-දේශපාලන ප්‍රතිසංස්කරණ වෙනුවෙන්, නිර්භයව බොහෝ කැපකිරීම් කලාහු ජනතාවගෙන් ද විශේෂයෙන්ම තරුණ තරුණියන්ගෙන් ද අපි ඉල්ලා සිටින්නේ, ඔවුන්ගේ සාධාරණ අපේක්ෂාවන් උදෙසා වු සාමකාමී, පක්ෂ දේශපාලනයෙන් ඔබ්බට වු අහිංසාවාදි උද්ඝෝෂණ දිගටම පවත්වාගෙන යන ලෙසයි. එසේම එකී උද්ඝෝෂණයන් වලදී රටේ පවතින පාලන නීතිවලට ගරු කරමින් ද ඓතිහාසික උරුමයන් හා වටිනාකම් ඇතුළු රාජ්‍ය හෝ පෞද්ගලික දේපළවලට හානි කරන සෑම ක්‍රියාවකින් ද වැළකී සිටින ලෙසයි.

2. පාලනයේ සිටින අය හෝ බලයේ දිගින් දිගටම සිටින්නට උත්සාහ දරන අය, කිසිඳු ආකාරයකින් තම අධිකාරිය අනිසි ලෙස භාවිතා නොකර මහජනතාවගේ ඉවසීම හිතාමතාම අවුස්සමින් ප්‍රචණ්ඩත්වය සඳහා වාතාවරණයන් ඇති කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක නොයෙදීම ද එකසේ වැදගත් වේ. බලය සඳහා වූ ඔවුන්ගේ අභිලාෂයන් තහවුරු කර ගැනීම සඳහා එවැනි ක්‍රියාවන් මෙවලමක් සහ නිදහසට කරුණක් ලෙස භාවිතා නොකල යුතුය.

3. මහජන නියෝජිතයන් ලෙස, 'පොදු මහජනතාවගේ හඬට' ගරු කරන ලෙසත්, ඒවාට අවනත වන ලෙසත්, තම යුතුකම් හා වගකීම් ඉටු කිරීමේදී රටේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙන ලෙසත්, එකි වැඩකටයුතු කඩිනමින් ඉටු කරන ලෙසත් අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමු. අප දේශය සාමූහිකව ආමන්ත්‍රණය කිරීමට සහ රට පත්ව ඇති අරාජික තත්ත්වයෙන් ගොඩ ගැනීමට 'එක්සත් හෝ සර්ව පාක්ෂික රජය'ක් පිහිටුවීමට තව දුරටත් ප්‍රමාද නොවි කැපවන ලෙස ඉල්ලා සිටිමු.

4. වගකිවයුතු සහ වගවියයුතු පාලනයක් සඳහා වන අවංක මහජන උත්සාහයන් වලදී සහ දැනට පවතින විරෝධතා සහ උද්ඝෝෂණ සම්බන්ධයෙන් රාජකාරි කටයුතු කිරීමේදී අවම බලය යෙදවීමේදී ජනතාවගේ කලකිරීම් සම්බන්ධයෙන් ප්‍රවේශමෙන් මෙන්ම සංවේදීව ක්‍රියා කරන ලෙස ත්‍රිවිධ හමුදාවෙන් සහ පොලිසියෙන් අපි ඉල්ලා සිටිමු. ඒ අනුව ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට පැවරී ඇති අභියෝගාත්මක වගකීම් පිළිබඳව අවධානයෙන් හා සංවේදීව සිටින ලෙසද විරෝධතාකරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

දේශයක් ලෙස 'වැටුණු රාජ්‍යයක' අභියෝගයන්ට සාමූහිකව මුහුණ දීමත්, ආමන්ත්‍රණය කිරීමත් මෙන්ම මෙයට පෙර නොවූ විරූ අර්බුදයේ අභියෝග ජය ගැනීමත් අපගේ දැඩි බලාපොරොත්තුව සහ යාච්ඤාව වේ. මේ සඳහා අපගේ සහාය, සහයෝගීතාවය සහ කැපවීම සහතික කර සිටිමු.

#368/6, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Telephone: +94 (11) 2671723 Fax: +94 (11) 2671721
E-Mail: info@nccsl.org | Website: www.nccsl.org

අත්සන් තබන ලද්දේ ඃ

**සාමාජික සභාවන්**

- ගරු ඩබ්ලිව්. පී. එබනීසර් ජොසප් දේවගැතිතුමා - සභාපති ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය සහ සභාපති ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාව
- අතිගරු දූෂාන්ත රැදිගු රදගුරුතුමා - ලංකා සභාව කොළඹ දියෝකීසිය
- අතිගරු කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරුතුමා - ලංකා සභාව කුරුණෑගල දියෝකීසිය
- ගරු හේෂාන් ද සිල්වා දේවගැතිතුමා - සභාපති ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය
- ගරු සමන් පෙරේරා දේවගැතිතුමා - සභාපති ශ්‍රී ලංකා ප්‍රෙස්බිටේරියන් සභාව
- අතිගරු ධර්මාචාර්ය ඩැනියල් එස්. තියාගරාජා- රදගුරුතුමා දකුණු ඉන්දියානු සභාව - යාපනය දියෝකීසිය
- ගරු ෂර්ලි එස්. ෆේබර් දේවගැතිතුමා - සභාපති ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
- කර්නල් නිහාල් හෙට්ටිආරාච්චි දේවගැතිතුමා - ප්‍රාදේශීය භාර මූලිකතුමා ගැලවීමේ හමුදාව
- ගරු ධර්මාචාර්ය ක්‍රිසෝ හැන්ඩි දේවගැතිතුමා - සභාපති ලංකා දේව සභා සංගමය
- ගරු හරීම් පීරිස් දේවගැතිතුමා -උප සභාපති/වැඩ බලන සභාපති සිව් චතුරශ සභාරංචි සභාව
- ගරු මැක්ස්වෙල් ඩොස් දේවගැතිතුමා - මහා ලේකම් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

**සාමාජික සාමයික ආයතන**

- ශ්‍රී ලංකා තරුණ ක්‍රිස්තියානි සංගමය
- තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය
- ශ්‍රී ලංකා බයිබල් සංගමය
- ක්‍රිස්තියානි සාහිත්‍ය සංගමය
- ශ්‍රී ලංකා ශිෂ්‍ය ක්‍රිස්තියානි ව්‍යාපාරය
- ජීවිතාලෝකය
- ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය පිළිමතලාව

14 07 2022